වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තේ ප්‍රවර්ධන නිලධාරී - චීනය

දේශීයව හා ගෝලීයව "සිලෝන් ටී" ප්‍රවර්ධනය කිරීමේ කාර්ය භාරය පවරමින් 1975 අංක 14 දරන තේ මණ්ඩල නීතිය මගින් සංස්ථාපිත, ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ කුටප්‍රාප්ත ආයතනය වන, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කොන්ත්‍රාත් පදනම මත චීනයේ - තේ ප්‍රවර්ධන නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමට ශක්තික, කාර්යශූර හා ප්‍රතිඵලදායී තැනැත්තෙකු සොයමින් සිටී. පත්වීම් ලාභියා, චීනයේ, බෙයිජිං නුවර, ශ්‍රී ලාංකික තානාපති කාර්යාලයේ, පදනම්ව ස්ථානගත කෙරෙනු ඇත.

රැකියා (කාර්ය) විස්තරය :

රැකියා ලාභියා විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කරගනු ඩස්, චීනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයත්, වාණිජ උපදේශක හා තේ ප්‍රවර්ධන අධ්‍යක්ෂකවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ චීනයේ සිලෝන් ටී ප්‍රවර්ධනය කිරීමේ කාර්යයේ වගකීම් භාරය දැරිය යුතුය.

සුදුසුකම් හා පළපුරුද්ද :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උපාධියක් - අලෙවිකරණය / ආර්ථික විද්‍යාව / වාණිජ්‍යය හෝ ව්‍යාපාර හෝ කළමනාකරණ ක්ෂේත්‍රයන්ගෙන් නම් වඩාත් මැනවි හෝ සමාන සුදුසුකම්

සහ

අලෙවිකරණය, විකුණුම් හෝ වෙළඳ ක්ෂේත්‍රයේ, රාජ්‍ය හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක, විධායක මට්ටමේ තනතුරක, අවම වශයෙන් වසර 3 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

අමතර සුදුසුකම් :

- ඉංග්‍රීසි භාෂාව හා චීන භාෂාව පිළිබඳව මනා / විශිෂ්ට හැකියාව.
- ජාත්‍යන්තර අලෙවිකරණය, විදේශීය ප්‍රවර්ධන කටයුතු, ගෝලීය වෙළ හෙළඳම් සහ බෙදාහැරීමේ ජාල පද්ධති, පිළිබඳ සේවාස්ථ පළපුරුද්ද චීන වෙළෙඳපලවල එවැනි පළපුරුද්ද සහිතවීම අමතර වාසියක් වනු ඇත.
- මහජන සම්බන්ධතා පිළිබඳ අනර්ඝ හුරු පුරුදු බව හා නැඹුරුතාව සහිතව, අලෙවිකරණ පසුබිමක් සහිතවීම හා වෙළඳ පල පර්යේෂණ සමාගම් මෙන්ම, අන්තර්ජාතික දූත්වීම් නියෝජිතායතන හා සමඟ වැඩ කිරීමෙන් ලත් පළපුරුද්ද සහිත වීම.
- විශේෂයෙන්, ආනයනකරුවන්, ගැනුම්කරුවන්, බෙදහරින්නන්, තොග වෙළෙන්දන් සහ සිල්ලර අලෙවිදම හා සමඟ සමීප සුහද සම්බන්ධතාව පවත්වාගැනීම සහ මෙහෙයුම්කරණ ක්ෂේත්‍රයේ දීර්ඝ කාලවේලාවන් තුළ වැඩකිරීමට ඇති ලැදියාව හා උන්සුකභාවය සහිත සමාජශීලී මිතුරු පෞරුෂත්වයක් සහිත වීම.
- වෙළඳපළ බුද්ධි වාර්තා පිළියෙළ කිරීමේ හැකියාව.

වැටුප් හා දීමනා (පාරිතෝෂිකය) :

(අ) විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද චක්‍රලේඛවලට අනුකූලව ඇ.එ.ජ. ඩොලර් වලට පරිවර්ත්‍ය කරනු ලබන රු. 26,000/- ක මාසික දීමනාවක්.

(ආ) ඉහත සඳහන් මාසික දීමනාවලට අමතරව ගෙවනු ලබන විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් තීරණය කරනු ලබන විදේශ සේවා දීමනා අදාළ වනු ඇත.

වයස් සීමාව :

අවුරුදු 22 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

වෙනත් කොන්දේසි :

- පත්වීම එක් (01) වසරක කාල සීමාවකට, කොන්ත්‍රාත් පදනම මත වනු ඇති අතර, (එම කොන්ත්‍රාත්තු කාල පරිච්ඡේදය, දෙපාර්ශවයේම එකඟතාවය සහිතව, පත්වීම්ලාභියාගේ කාර්ය සාධන ඇගයීම මත දීර්ඝ කරනු ලැබිය හැකිය)
- තෝරාගනු ලබන අපේක්ෂකයා හට කොළඹ සිට චීනයටත් තම කාර්ය කර්තව්‍ය සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසු නැවත කොළඹටත් යාමට හා ඒමට සාමාන්‍ය (පිරිමැසුම්) පංතියේ ගුවන් ගමන් පහසුකම් හිමි වනු ඇත.

අයදුම්පත් :

අයදුම්පත්, මෙම කාර්යාලයෙන් ලබාගත හැකි හෝ අපගේ වෙබ් අඩවිය වන www.pureceylontea.com වෙතින් බාගත කළ හැකි, නියමිත ආකෘතිපත්‍ර මත සකස්කර උප්පැන්න සහතිකයේ පිටපතක්, අදළ අධ්‍යාපනික සහ වෘත්තීයවේදී සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීමේ ලියකියවිලි වල (සහතිකවල) පිටපත් ආදිය සමඟ 2017 **ජුනි 23 වන දින, හෝ ඊට පෙර** ලැබෙනසේ, පහත සඳහන් ලිපිනයට ලේඛනගත (ලියාපදිංචි කළ) තැපෑලෙන්, එවිය යුතුය. අයදුම්කරන තනතුර, කවරයේ වමිපස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කරනු මැනවි. මෙම අවශ්‍යතාවයන් හට අනුකූල නොවන අයදුම්පත්, ප්‍රතික්ෂේප කරනු ලැබීමට හාජනය වනු ඇත.

අධ්‍යක්ෂක ජනරාල්,

ශ්‍රී ලංකා තේ මණ්ඩලය,

574, ගාලු පාර, කොළඹ 03.